චක්‍රලේඛ අංකය : 02/2017

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/01/චක්‍ර ලේඛ

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgdept.lk

දිනය / திகதி / Date: 2017.06. 09

සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

**ගංවතුර සහ නායයෑම් හේතුවෙන් පීඩාවට පත්වූ ජනතාව සඳහා**
**විවාහ, උප්පැන්න සහ මරණ සහතික නොමිලයේ නිකුත් කිරීම**

වර්ෂ 2017 මැයි මාසයේදී දිවයිනේ විවිධ ප්‍රදේශවල ඇතිවූ ගංවතුර සහ නායයෑම් ආදී ආපදාවන් හේතුවෙන් පීඩාවට පත්වූ මහජනයාට සහනයක් වශයෙන් ඔවුන්ගේ විවාහ, උප්පැන්න සහ මරණ සහතික පිටපත් ගාස්තු අයකිරීමකින් තොරව නිකුත් කිරීමට තීරණය කර ඇති බව, ස්වදේශ කටයුතු ලේකම්ගේ අංක HAF-1/10/BR/Prc/5 සහ 2017/06/02 දිනැති ලිපියෙන් දන්වා ඇත.

02. මෙම සහනය යටතේ සහතික පිටපත් ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ගංවතුර/නායයෑම් ආදී අපදාවන් හේතුවෙන් තම නිවසේ ලියකියවිලි හානියට පත්වූ අය පමණි. මීට අදාලව අයදුම්කරුගේ ස්ථිර පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් සහතික කළ ලිපියක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, එම ලිපිය අයදුම්පත සමග අමුණා තැබිය යුතුය. මෙහිදී එක් අයදුම් පතක් සඳහා නිකුත් කරන උපරිම සහතික පිටපත් සංඛ්‍යාව 03 (තුනක්) පමණි. මෙම සහනය 2017/06/01 දින සිට 2017/08/31 දින දක්වා මාස තුනක කාලයක් සඳහා පමණක් ක්‍රියාත්මක වේ.

03. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විවාහ, උප්පැන්න සහ මරණ අයදුම්පත් භාරගන්නා ලේඛනයේ, මෙම සෑම අයදුම්පතක්ම වෙන්කර හඳුනා ගත හැකිවන පරිදි සටහනක් යෙදීමට කරුණාකර කටයුතු කරන්න. මෙම අයදුම්පත් සඳහා නිකුත් කරනු ලබන ඒ 86 රිසිට් පත්වල "නොමිළයේ නිකුත් කරන ලදී" යනුවෙන් විශේෂ සටහනක් යෙදීමටද පියවර ගන්න. තවද මෙම සහනය යටතේ සහතික පිටපත් නිකුත් කිරීම පිළිබඳ මාසික වාර්තාවක් මේ සමග අමුණා ඇති ආකෘතියෙන්, ඊළඟ මාසයේ පළමු සතිය ඇතුළත මා වෙත එවන ලෙසද වැඩිදුරටත් කාරුණිව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්
Neil De Alwis
Registrar General

පිටපත්:-

1. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු, දැ.ගැ.ස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
3. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්, මධ්‍යම ලේඛනාගාරය - අවශ්‍ය කටයුතු සඳහා
4. කලාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
5. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්/ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.
6. ප්‍රධාන ගණකාධිකාරී - අවශ්‍ය කටයුතු සඳහා
7. අභ්‍යන්තර විගණන අංශය - අවශ්‍ය කටයුතු සඳහා